පාතදුම්බර ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියක් ඉටුකර නොතිබියදී රු.6,813,750 ක් ණය හිමියන් ලෙසද රු.4,278,218 ක් වත්කම් ලෙසද ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුම තුළින් ගැලපීමට කටයුතු කරමි. |
| (ආ) | වත්කම් 5 ක් සංවර්ධනය සඳහා දැරූ රු.2,300,000 ක්, රු.795,120 ක් වූ ත්‍රීරෝද රථයක් හා යන්ත්‍රයක් ද ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුම තුළින් ගැලපීමට කටයුතු කරමි. |
| (ඇ) | වෙළඳ බලපත්‍ර ආදායම රු.50,000 ක් හා ස්ථාවර තැන්පත් පොළී ආදායම රු.84,109 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුම තුළින් ගැලපීමට කටයුතු කරමි. |
| (ඈ) | ණයහිමියෝ රු.21,117,122 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුම තුළින් ගැලපීමට කටයුතු කරමි. |

1.3.2 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලා ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.133,597,934 ක් වූ ගිණුම් විෂයයන් 14 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.24,533,546 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතුවේ. | මෙම වෙනස සොයා බලා නිරවුල් කර ගනිමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසරක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.11,640,127 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ශේෂ සොයා බලා නිරවුල් කරමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාල විශ්ලේෂණයට අනුව වසර 1 ක කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ශේෂවල එකතුව රු.30,440,501 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ශේෂ සොයා බලා නිරවුල් කරමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු. 100,481,496 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළව ස්ථාවර වත්කම් ලේඛනය හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී උපලේඛන සැපයීමට කටයුතු යොදා ඇත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | රු.2,533,660 ක් වටිනා කල් ඉකුත් වූ තැන්පතු 122 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම තැන්පතු පිළිබඳ සොයා බලා නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,876,032 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,949,326 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,083,000 | 7,486,367 | 8,149,308 | 4,313,761 | 7,418,000 | 6,776,768 | 6,876,509 | 3,869,944 |
| (ii) | කුලී | 657,000 | 2,127,950 | 2,137,240 | 412,211 | 685,000 | 1,400,440 | 1,387,160 | 401,351 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,200,000 | 2,200,000 | 2,420,040 | (220,040) | 2,200,000 | 2,200,000 | 2,480,875 | (286,875) |
| (iv) | වෙනත් ආදායම් | 12,986,720 | 14,385,688 | 1,924,688 | 21,290,519 | 26,136,000 | 15,318,437 | 13,367,602 | 6,009,582 |
| | | 22,926,720 | 26,200,005 | 14,631,276 | 25,796,451 | 36,439,000 | 25,695,645 | 24,112,146 | 9,994,002 |

2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.36,194,007 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.14,631,276 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 40 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | පිළිගනිමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙළින් රු.2,067,723 ක් හා රු.19,907,067 ක් විය. | අදාල මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018.12.31 දිනට නිවැරදි ශේෂ පිළිබඳව තොරතුරු ලබාගෙන හිඟ මුදල් අයකර ගනිමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 12 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීම කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සැලසූ කර්තව්‍යයන් 27 ක් ඉටු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව අයවැය පිළියෙල කර කර්තව්‍යන් ඉටු කළ යුතුවේ. | ක්‍රියාකාරී සැලැස්ම පාදක කරගෙන වාර්ෂික අයවැය පිළියෙල කර ඇත. ඉදිරියේදී මෙම ගැටළු ඇති නොවනු ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී තිරසර සංවර්ධන අභිමතාර්ථ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | භාවිතයට සුදුසු පරිදි කඩ කාමර සකස් නොකිරීම මත රු.846,000 ක කඩ කුලී ආදායමක් හා 2014 දෙසැම්බර් 11 වන දින තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම මත රු.499,500 ක ආදායමක් අහිමි වී තිබුණි. | භාවිතයට සුදුසු ආකාරයට සකස් කර ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුවේ. | වෙළඳ සංකීර්ණයේ ව්‍යුහය වෙනස් කර අලුත්වැඩියා කිරීම සඳහා යෝජනා කර ඇත. |
| (ආ) | මඩවල නගරය අසලින් ගලායන ඔය අවහිර වන පරිදි ඉදිකිරීම් සිදුකර තිබූ නමුත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඔය රක්ෂිතයේ අනවසර ඉදිරිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ඉදිකිරීම් වහාම අත්හිටුවා නීත්‍යානුකූල කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කර ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක පුරප්පාඩු 13 ක් විය. | සේවක පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මඩවල නගරයේ සභාවට අයත් පර්චස් 10.9 ක ඉඩමෙන් පර්චස් 5.26 ක ප්‍රමාණයක් අනවසරයෙන් භුක්ති විඳිමින් තිබූ අතර, සභා ඉඩමේ ඉදිකර තිබූ කඩ කාමර 3 ක් වසර 10 කට අධික කාලයක සිට වසා දමා තිබුණි. | සභාව සතු වත්කම් ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුවේ. | අනවසරයෙන් අල්ලාගත් ඉඩම් කොටස සඳහා සන්තකය ආපසු ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත ලියවිලි ඉදිරිපත් කර ඇත. |

3.4.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රු.16,695,000 ක් වටිනා බැකෝ යන්ත්‍රයෙන් ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යන්ත්‍රෝපකරණ වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කළ යුතුවේ. | ආදායම් උපයා ගැනීමට භාවිතා කෙරේ. |

3.4.3 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.1,259,350 ක් වටිනා ජල උපකරණ දිගු කාලයක් නිකුත් නොවී ගබඩාවේ පැවතුණි. | අවශ්‍යතාවය අනුව භාණ්ඩ මිලට ගැනීමට කටයුතු කළ යුතුවේ. | විමසුමේ දක්වා ඇති ජලනල උපකරණ අවශ්‍යතාවය අනුව තීරණය කරන බව දන්වමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආදායම් විෂයන් 21 ක් සඳහා රු.964,000 ක ඇස්තමේන්තුගත ආදායමෙන් කිසිදු ආදායමක් උපයා නොතිබූ අතර, වැය විෂයයන් 57 ක් සඳහා සලසා දී තිබුණු රු.8,994,500 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණයෙන් ඉතිරි කර තිබුණි. | අයවැය වඩාත් නිවැරදි දත්තයන් පදනම් කර ගනිමින් සැකසීම හා විචලනයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |